ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 2 2012 දෙසැම්බර්

## මැදරට කුඩා තේ වතු හිමියන්ගේ අවධානය පිණිසයි

## මේ කුහුඹුවා ඔබත් දුටුවාද ?



තේ වගාවට දැඩි ලෙස හානි කරන කුහුඹුවන් විශේෂයක් මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ හා බොක්කාවල යන ප්‍රදේශ වල තේ ඉඩම් කිහිපයකින් ඉකුත් සති කිහිපය තුළදී සොයාගනු ලැබුවා.

රතුවන් තැඹිලි පැහැයට හුරු මේ කුහුඹුවා "දිමියාගේ" හැඩයට බොහෝ සෙයින් සමාන නමුත් ඊට වඩා ප්‍රමාණයෙන් කුඩා වේ. මෙම කුහුඹු විශේෂය ප්‍රථම වතාවට මාතර දිස්ත්‍රික්කයේ දෙණියාය ප්‍රදේශයෙන් සොයාගත් දෙණියාය කුහුඹුවා ලෙස නම්කර ඇති කුහුඹුවාම බව හඳුනාගෙන ඇත.

කුහුඹුවා ගේ ක්‍රියාකාරීත්වය නිසා හානි සිදුවන්නේ තේ පඳුරේ මූල පද්ධතියටයි. එමගින් තේ පඳුරේ වර්ධනය අඩාල වී මල් ගෙඩි හට ගැනීම සිදුවන අතර පත්‍ර ප්‍රමාණය අඩු වීම නිසා තේ පඳුර ඉපල් සහිත තත්වයට පත්වීම සිදුවිය හැකියි. මෙම හානිය මුලින්ම ඉඩමේ එක් කෙළවරකින් ආරම්භ වී පසුව අනෙකුත් ප්‍රදේශ කරා ව්‍යාප්ත වන අතර ඉඩමේ කොස්, දෙල්, කිතුල් හා පුවක් ගස් ආසන්නයේ ඇති තේ පඳුරු වලට මෙම හානිය ඇතිවීමේ වැඩි ඉඩකඩක් පවතිනවා.

ඔබේ තේ ඉඩමේද මෙබඳු හානියක් දැකගත හැකි නම් ඔබ ප්‍රදේශයේ තේ පරීක්ෂක මහතා දැනුවත් කර ළඟම ඇති තේ පර්යේෂණායතන කාර්යාලය ඇමතීමෙන් අවශ්‍ය උපදෙස් නොපමාව ලබාගත හැකියි. ඔබගේ නිරන්තර අවධානය මෙම පළිබෝධකයාගේ හානිය පාලනය කිරීමෙහි ලා අතිශයින්ම වැදගත්ය.

**සී. ඊ. මුණසිංහ**
**ජනක රාජසිංහ**